# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

## ප්‍රාථමික ශිල්පීය- නොවන සේවා ගණය (PL-1) සඳහා වන 1/ 2/3 වන කාර්යක්ෂමතා කඩඉම් විභාග -2019

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික - ශිල්පීය නොවන සේවා ගණය (PL-1) සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද බඳවා ගැනීමේ පරිපාටියේ විධි විධාන අනුව පැවැත්වීමට නියමිත 1 වන 2 වන හා 3 වන කාර්යක්ෂතා කඩඉම් විභාග 2019 ඔක්තෝම්බර් මස අවසන් සතියේ සිට පැවැත්වෙන බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. උක්ත විභාගය කොළඹ දී පවත්වනු ලැබේ.

03. මෙම විභාගය සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පවත්වනු ලැබේ.

04. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන සියළුම විභාග නීති රීති පිළිපැදීමට සෑම විභාග අපේක්ෂකයෙකුම බැඳී සිටී.

05. **විභාගය සඳහා අයදුම් කිරීම**

a. මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූලවිය යුතුය.

b. ආදර්ශ අයදුම්පත්‍රයේ දක්වා ඇති පරිදි අංක 01 සිට 05 දක්වා කොටස පළමු පිටුවට ද, ඉතිරි කොටස දෙවන පිටුවට ද ඇතුළත් වන පරිදි A- 4 ප්‍රමාණයේ එක් කඩදාසියක දෙපැත්ත භාවිතා කර පරිගණක ගත කර හෝ පැහැදිලි අත් අකුරින් අයදුම්පත් සම්පූර්ණ කල යුතුය.

c. අයදුම්කරුවකු විසින් එක් විභාගයක් සඳහා ඉදිරිපත් කළ යුත්තේ එක් අයදුම් පතක් පමණි.

d. විභාග එකකට වැඩි ප්‍රමාණයක් සඳහා අයදුම් කරන නිලධාරීන් එක් එක් විභාගය සඳහා වෙන් වෙන් වශයෙන් අයදුම්පත් එවිය යුතු අතර අයදුම් කරනු ලබන්නේ කී වැනි විභාගයද යන්න හා අදාළ විෂයයන් ඉතා පැහැදිළිව සඳහන් කළ යුතුය.

e. විභාග අයදුම්පත ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරනු ලබන නිලධාරියෙකු ඉදිරිපිටදී අයදුම්කරු විසින් අත්සන් කළ යුතු අතර සහතික කරන්නාගේ නිල මුද්‍රාව තැබිය යුතුය.

f. සියළුම අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානියා මගින් පමණක් ඉදරිපත් කළ යුතු අතර අදාළ ස්ථානයේ ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව තිබිය යුතුය.

g. අදාළ අයදුම්පත් සහිත ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ තමා අයදුම් කරන විභාගයේ නම සහ I වන II වන හෝ III වන කාර්යක්ෂතා කඩඉම් විභාගයද යන්න ඉතා පැහැදිලිව අනිවාර්යයෙන්ම සඳහන් කළ යුතුය.

h. අදාළ උපදෙස් අනුව පිළියෙළ කරන ලද අයදුම්පත් අයදුම්කරුවන් විසින් තම ආයතන ප්‍රධානියා මගින් **2019.10.20** දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ, **අධ්‍යක්ෂ ජනරාල්, විභාග ඒකකය, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව, 4 වන මහල, සෙත්සිරිපාය, පළමු අදියර, බත්තරමුල්ල** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

06. අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් හා ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07. මෙම විභාගය සඳහා අදාළ උපදෙස් පරිදි අයදුම් කර ඇති අයදුම්කරුවන් සඳහා පමණක් විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ලැබේ.

08. මෙම විභාගය සිංහල හා දෙමළ මාධ්‍ය දෙකෙන් පමණක් පවත්වනු ලැබේ. අයදුම් පතෙහි සඳහන් කරනු ලබන භාෂා මාධ්‍යය පසුව වෙනස් කළ නොහැක.

09. විභාග පිළිබඳ විස්තර:

විභාග අපේක්ෂකයන් විසින් පහත දැක්වෙන විභාග විෂය නිර්දේශ වලට අදාළ වාචික විභාග අතරින් තමා අයදුම් කර ඇති විභාග සඳහා පෙනී සිටිය හැක.

09.1. පළමු (1) වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා වන විෂය නිර්දේශය

| ලකුණු ලබා දෙනු ලබන නිර්නායකයන් | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| 1.සේවකයා තමා සේවය කරන ආයතනයට පැවරෙන කාර්යයන් පිළිබඳව අවශ්‍ය වන පරිදි දැනුම ලබා අත්දැයි මැන බැලීම. | 30 | 40% |
| 2.සාමන්‍ය කාර්යාල ක්‍රම හා ආයතනික පරිපාලන ක්‍රමවේද පිළිබඳව තම සේවයට අදාළ දැනුම | 30 | |
| 3.තනතුරට පැවරෙන විවිධ කාර්යයන් පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් හා ප්‍රවීනතාවයක් අත්පත් කර ගෙන ඇත්දැයි මැන බැලීම. | 40 | |
| එකතුව | 100 | |

09.2. දෙවන (2) වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා වන විෂය නිර්දේශය

| ලකුණු ලබා දෙනු ලබන නිර්නායකයන් | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ දී ආවරණය වූ විෂයන්ට අදාළව ගතවූ සේවා කාලය තුළ අදාළ ක්ෂේත්‍රය තුළ සිදු වී ඇති පරිපාටිමය වෙනස් වීම් පිළිබඳ සේවකයාගේ දැනුම සහ ඔවුගේ කාර්යයන්ට අදාළ නව්‍යකරණ පිළිබඳ සේවකයාගේ කුසලතා මැන බැලීම | 100 | 40% |

09.3. තුන් (3) වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා වන විෂය නිර්දේශය

| ලකුණු ලබා දෙනු ලබන නිර්නායකයන් | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| පලමුවන හා දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේදී ආවරණය වූ විෂයන්ට අදාළව ගත වූ සේවා කාලය තුළ අදාළ ක්ෂේත්‍රය තුළ සිදු වී ඇති පරිපාටිය වෙනස් වීම් පිළිබඳ සේවකයාගේ දැනුම සහ ඔහුගේ කාර්යයන්ට අදාළ නව්‍යකරණ පිළිබඳ සේවකයාගේ කුසලතා මැන බැලීම | 100 | 40% |

එස්.ඊ.ආර්.ටී.එම්.එස්.පී.බණ්ඩාර
අධ්‍යක්ෂ ජනරාල්

2019.10.10